# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1999/37 - 2016 දෙසැම්බර් මස 29 වැනි බ්‍රහස්පතින්දා - 2016.12.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මාකදුර ජල සම්පාදන ක්‍රමය යටතේ වර්ධක පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 07 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැඳුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1242.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 302 බී, දිද්දෙණිපොත උතුර ග්‍රාම නිලධාරි වසමේ දිද්දෙනිපොත ගමේ පිහිටි රංචගොඩගේ, දිවෙල්වත්ත කනත්ත නැමති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 02 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | දිද්දෙනිපොත මහ විද්‍යාල මාවත ; |
| *නැගෙනහිරට* | : | දිද්දෙනිපොත මහ විද්‍යාල මාවත ; |
| *දකුණට* | : | මාකදුර සිට මුලටියානයට දක්වා වූ ප්‍රධාන මාර්ගය ; |
| *බටහිරට* | : | නිවාස ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ආර්. එල්. කරුණාවතී මිය,<br>
අංක 66,<br>
දිද්දෙනිපොත - මුලටියන.

01 - 393